**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2014**

-----------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අභිතකර මතය සඳහා පදනම**

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංග වලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1** **අහිතකර මතය**

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

----------------------------------------

**2.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

--------------------------------

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01**

වත්කම් හා වගකීම් ගිණුම් වල ශේෂයන් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.මිලියන 141 ක වගකීම් ගිණුම් වල අසාමාන්‍ය හර ශේෂයක් සහ රු.මිලියන 59 ක වත්කම් ගිණුම්වල අසාමාන්‍ය බැර ශේෂයක් එකිනෙකට හිලව් කර තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ 2014 දෙසැම්බර් 31 දිනට වූ ජංගම බැරකම් හා ජංගම වත්කම් එම වටිනාකම් වලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02**

තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට අගය කළ යුතු වුවද, සංස්ථාව විසින් 2014 දෙසැම්බර් 31 දිනට පැවති නිමි ද්‍රව්‍ය තොග සහ අමුද්‍රව්‍ය තොග පිරිවැය වටිනාකමට ගිණුම් වලට ගෙන තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 57.3 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 3047 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19**

ඉකුත් වසරෙහි සිදුකල ආයු ගණන ආගණන වාර්තාව සඳහා පාදක වූ උපකල්පනයන් සමාලෝචිත වර්ෂයේදී ද, නොවෙනස්ව පැවති බව සලකා පාරිතෝෂික දීමනා වෙනුවෙන් කිසිදු වෙන් කිරීමක් සිදුකොට නොතිබුණි. එසේ වුවද, එම උපකල්පනයන් අතුරින් සංස්ථාවේ සේවක පිරිවැටුම මෙන්ම සේවකයින්ගේ සේවා කාලය යනා දී මූලික නිර්නායකයන් සමාලෝචිත වර්ෂයේදී ද සැලකිය යුතු ලෙස විචලනය වී තිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37**

නිශ්චිතව හඳුනාගත හැකි බැදීම් වෙනුවෙන් අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීමක් සිදු කල යුතු වුවද , සංස්ථාවට එරෙහිව පවරා තිබූ නඩු 02 කට අදාළව රු.මිලියන 24.9 ක් සඳහා මූල්‍ය ප්‍රකාශන වල කිසිදු වෙන් කිරීමක් සිදුකොට නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වූ ණයගැති ශේෂයේ රු.මිලියන 501.3 ක අසාමාන්‍ය බැර ශේෂයක් වූයෙන් එදිනට ණයගැති වටිනාකම එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ආ) සංස්ථාවේ එක් එක් අංශයන් අතර අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුම් නිවැරදිව සැසඳුම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 12.8 ක අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුම් හර ශේෂයක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) අවසන් තොගය අගය කිරීමේ දී හඳුනා ගත් එකතු වටිනාකම රු.මිලියන. 20.8 ක් වූ තොග හානි සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු එකතුව රු.මිලියන 184.7 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ ගොඩනැගිලි කුලියට දීමෙන් සිමෙන්ති සමාගමෙන් හා ලංකා සිමෙන්ති සංස්ථාවෙන් පිළිවෙලින් ලැබිය යුතු කුලී හා අනෙකුත් ගාස්තු රු. 2,130,556 ක් අඩුවෙන් හා රු. 710,677 ක් වැඩියෙන් ගිණුම් ගත කොට තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව කෙරීගෙන යන වැඩ ව්‍යාපෘති වෙනුවෙන් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු රු.මිලියන 1,933.7 ක් හා ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 2,454.5 ක් අඩුවෙන් ගිණුම් ගත කොට තිබුණි.

(උ) පසුගිය වර්ෂයන්ට අදාළ ව්‍යාපෘති 05 කට අදාළ රු.මිලියන 6.95 ක අලාභයක් සහ ව්‍යාපෘති 09 කට අදාළ රු.මිලියන 15.43 ක ලාභ අතීතානුයෝගීව ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

(ඌ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනට විලම්භීත බදු වත්කම ගණනය කිරීම සඳහා යොදාගත් තාවකාලික බදු වෙනස්කම්හි එකතුව රු.මිලියන 392.5 ක් වූ අතර ඒ මත වන තාවකාලික බදු බලපෑම වෙනුවෙන් ආදායම් ප්‍රකාශයට බැරකරන ලද බදු අධි වෙන්කිරීම රු. මිලියන 32.87 ක් විය. විගණනයට අනුව තාවකාලික බදු වෙනස්කම් හි එකතුව රු. මිලියන 190.8 ක් වූ අතර ඒ අනුව වර්ෂයට අදාළ ගැළපිය යුතු බදු අධි වෙන්කිරීම රු. මිලියන 8.7 ක් විය. ඒ අනුව ස්ථාවර වත්කම්වලට අදාළ විලම්භීත බදු සඳහා වූ තාවකාලික වෙනස සහ ඉදිරියට ගෙන යන ලද බදු අලාභ වටිනාකම් නිවැරදිව ගණනය නොකිරීම මත වර්ෂයේ ලාභයට ගලපන ලද අධි බදු වෙන්කිරීම සහ විලම්භීත බදු වත්කම රු. මිලියන 24.2 කින් අධි ගණනය වී තිබුණි.

(එ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවන ලද තක්සේරු දැන්වීම් වාර්තා අනුව එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, උපයන විට ගෙවීම්, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, ජාතිය රැකගැනීමේ දායකය යනාදී බදු කාණ්ඩ යටතේ පැහැර හැරි බදු ලෙස රු.මිලියන 148.5 ක් ද ඊට අදාළ දඩමුදල් ලෙස රු.මිලියන. 40.5 ක් ද සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවීමට සිදු වී තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන වල රු.මිලියන. 3.7 ක් සඳහා පමණක් දඩ මුදල් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඒ) ණයගැති හානිකරණ වටිනාකම් ගණනය කිරීම සඳහා යොදාගත් කේවල ණයගැතියන් 81 දෙනෙකුගේ එකතු වටිනාකම රු. මිලියන 27.6 ක් සඳහා රු. මිලියන 122.7 ක් ණය ගැති

හානිකරණය වෙනුවෙන් ප්‍රතිපාදනය කිරීම හේතුවෙන් රු. මිලියන 95.1 ක අධි වෙන්කිරීමක් කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

විලම්භිත බදු ගණනය කිරීම් සඳහා යොදා ගත් දේපල පිරියත හා උපකරණයන්හි තාවකාලික වෙනස සඳහා විගණනය වෙත ඉදිරිපත් කරන ලද උපලේඛණය අනුව ශේෂය රු. මිලියන 92.55 ක් වුවද විගණනයේ දී සිදු කරන ලද ගණනය කිරීම් අනුව එය රු. මිලියන 364.69 ක් වූයෙන් රු. මිලියන 272.14 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් ඊට අදාළ උපලේඛන හා ලෙජර් ගිණුම් ශේෂයන් සමඟ සැසදීමේ දී පහත සඳහන් නොසැසඳීම් දක්නට තිබුණි.

| **අයිතමය** | **මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය** රු.මිලියන | **උපලේඛනය අනුව ශේෂය** රු.මිලියන | **ලෙජර් ගිණුම් අනුව ශේෂය** රු.මිලියන |
|---|---|---|---|
| ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 319.2 | 362.3 | - |
| අනෙකුත් ලැබිය යුතු ආදායම් | 97.8 | - | 73.9 |
| උපචිත වියදම් හා අනෙකුත් වෙන්කිරීම් | 1,133.8 | - | 1,143.7 |
| ගෙවන ලද පාරිතෝෂික දීමනා | 10.1 | 14.3 | - |
| වෙළෙද ණයහිමියෝ | 810.5 | 811.2 | - |

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

පහත සඳහන් රු.මිලියන 7,082.41 ක් වටිනා ගිණුම් විෂයයන් ඉදිරියෙන් දැක්වෙන සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| | **ගිණුම් විෂයය** | **වටිනාකම (රු.මිලියන)** | **ඉදිරිපත් නොවූ සාක්ෂි** |
|---|---|---|---|
| (අ) | නාරාහේන්පිට පෙරසවි අංගනය වෙනත් ස්ථානයකට ගෙන යාමෙන් වූ මූලධන ලැබීම | 22.65 | ලැබීම් ප්‍රභවය සහ පැවරුම් ලේඛන ඇතුළත් ලිපිගොනු |
| (ආ) | රඳවා ගැනීම් බදු | 62.71 | රඳවා ගැනීම් බදු සහතික පත්‍ර පිටපත් |
| (ඇ) | බැංකු ගිණුම් අංක 6437 හා 6662 ට අදාළ ගෙවීම් | 39.00 | ගෙවීම් වවුචර පත්‍රිකා |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ණයගැති වටිනාකමින් අඩුකරන ලද භාණ්ඩ හා සේවා බදු හා එකතු කල අගය මත බදු | 998.12 | |
| (ඉ) | වෙළෙඳ සහ අනෙකුත් ණයහිමි ශේෂය | 320.7 | |
| (ඊ) | විදේශ ගැණුම් පාලන ගිණුම | 40.4 | උපලේඛන |
| (උ) | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් | 98.47 | |
| (ඌ) | උපචිත වියදම් සඳහා වෙන් කිරීම් | 788.46 | |
| (එ) | ඉදිරියට කළ ගෙවීම් | 20.47 | |
| (ඒ) | අවසන් තොග | 17.26 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (ඔ) | බැංකු ගිණුම් ශේෂ - විදේශීය | 7.84 | බැංකු සනාථ කිරීම්, බැංකු ප්‍රකාශන, බැංකු සැසඳුම්, භාර උපදෙස් පත්‍රිකා |
| (ඕ) | බැංකු ගිණුම් ශේෂ - දේශීය | | |
| | (i) ජංගම ගිණුම් සහ ඉතුරුම් හා කාලීන තැන්පතු | 49.77 | ඉතුරුම් තැන්පතු සහතිකපත් හෝ පාස්පොත් පිටපත්, බැංකු ශේෂ තහවුරු කිරීම් ලිපි |
| | (ii) බැංකු අයිරාව | 0.98 | ශේෂ තහවුරු කිරීම් ලිපි |
| (ක) | වෙළෙඳ ණයගැති ශේෂය | 4,545.65 | ශේෂ සනාථ කිරීම් |
| (ග) | සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම් සහ සේවා අත්තිකාරම් | 17.79 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ජ) | ගණුදෙණුකරුවන්ගෙන් ලද මුදල් | 52.14 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| | | ----------- | |
| | | **7,082.41** | |
| | | ====== | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. මිලියන 4,545.9 ක වෙළඳ ණයගැති ශේෂයෙන් සියයට 95 කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතුව තිබූ අතර ඉන් රු. මිලියන 1,907.9 ක් වර්ෂ 03 කට වඩා කල් ඉකුත් වූ ශේෂ විය.

(ආ) ඉහත ණයගැති ශේෂය තුළ ඉදිකිරීම් හා ඉදිකිරීම් උපාංග අංශ විසින් සිදු කරන ලද ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් 2011 වර්ෂයේ සිට ලැබිය යුතු රු. මිලියන 1,044.7 ක් 2014 දෙසැම්බර් 31 දින දක්වා අය වී නොතිබුණු අතර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව උක්ත ව්‍යාපෘති වෙනුවෙන් සංස්ථාවට ගෙවිය යුතු වටිනාකම රු. මිලියන 567.6 ක් වූයෙන් ඒ අතර රු. මිලියන 477.1 ක වෙනසක් පැවතුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශයේ ණයගැති අපහායනය සඳහා වෙන් කිරීම මුළු ණයගැති වටිනාකමින් සියයට 87 ක් වැනි ඉහල මට්ටමක පැවතුණි.

(ඈ) කඩ කාමර 97 කින් සමන්විත මරදාන මගී පාලමෙහි ඉදිකර තිබූ කඩ සංකීර්ණයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට හා 2015 ජූලි 30 දිනට පිළිවෙලින් රු. මිලියන 1.04 ක් හා රු. මිලියන 0.9 ක කුලී ආදායමක් ලැබිය යුතුව තිබුණි.

(ඉ) මරදාන මගී පාලමෙහි ප්‍රචාරණ දැන්වීම් පුවරු සඳහා වූ ඉඩ ප්‍රමාණය තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයකට ලබා දී තිබුණු අතර එම ආයතනය නැවත එම ඉඩ ප්‍රමාණය පෞද්ගලික ආයතනයක් වෙත කුලියට දී රු. 600,000 ක මුදලක් ලබා ගෙන තිබුණ ද, එම මුදල් සංස්ථාවට ලබා ගැනීම සඳහා විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ඊ) සංස්ථාවේ ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම පිණිස දින 30 ක් ඇතුළත පියවීමේ පදනමින් මත සැපයුම්කරුවන් වෙත ලබා දී තිබූ ඇණවුම් මත චෙක්පත් අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු. මිලියන 412.8 ක් වූ අතර ඉන් රු. මිලියන 239.6 ක් වර්ෂයක කාලයක් ඉක්ම වූ ඒවා විය.

(උ) සංස්ථාවේ ප්‍රධාන ගොඩනැගිල්ලෙහි කොටසක් ලංකා සිමෙන්ති සමාගමට 2007 ජනවාරි 01 සිට 2008 දෙසැම්බර් 31 දින දක්වා සහ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට 2007 ජනවාරි 01 සිට 2009 දෙසැම්බර් 31 දින දක්වා කුලී පදනම මත ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඒ සඳහා ලැබිය යුතු කුලී වටිනාකම හා අනෙකුත් ගාස්තු පිළිවෙලින් රු.මිලියන 21.7 ක් හා රු.මිලියන 8.5 ක් විය. එසේ වුවද, මෙම වටිනාකම් අයකර ගැනීම සඳහා කිසිදු නෛතික ක්‍රියාමාර්ගයක් මෙතෙක් ගෙන නොතිබුණි.

(ඌ) ඉදිකිරීම්, ඉදිකිරීම් උපාංග, යාන්ත්‍රික හා විදුලි, යන්ත්‍රෝපකරණ හා උපාංග යන අංශවල ව්‍යාපෘති 71 ක් සඳහා 2005 වර්ෂයේ සිට රු.මිලියන 208.8 ක සමුච්චිත පිරිවැයක් දරා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කර නොතිබුණි. මෙම ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 15 ක් ආරම්භ කොට වසර 03 ඉක්මවා තිබුණි.

(එ) 2012 වර්ෂයේ සිට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු.මිලියන 19.9 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ද, නිරවුල් කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ නිම වී තිබූ ව්‍යාපෘතීන්හි කොන්ත්‍රාත්කරුවන් විසින් රඳවා ගත් මුදල් හා අත්තිකාරම් එකතුව රු.මිලියන 1,512.7ක වටිනාකමින් රු.මිලියන 931.2 ක් වසර තුනකට වඩා පැරණි වූ අතර ඒවා අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඔ) උපකොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් නියමිත කාලපරිච්ඡේදය තුළ නිරවුල් නොකිරීම නිසා ගිණුම් වල ඉදිරියට ගෙනවිත් තිබූ අතර එම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම රු.මිලියන 414.1 ක් විය. මෙයින් රු.මිලියන 413.2 ක් වසර තුනක් ඉක්මවා තිබුණු අතර ශ්‍රම උපකොන්ත්‍රාත්කරුවන් සඳහා

ලබා දී තිබුණු අත්තිකාරම් වටිනාකමින් 2014 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂය රු.මිලියන 195.1 ක් විය.

## 2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වන වගන්තිය | සංස්ථාව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 396 | නිකුත් කල නමුත් උපලබ්ධි නොවූ මාස 06 ඉක්මවූ එකතුව රු.මිලියන 7.9 ක් වටිනා චෙක්පත් 69 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 756 | වැඩබිම් 13 කට අදාළ රු.මිලියන 2.9 ක් වටිනා අමුද්‍රව්‍ය තොග හා වැඩබිම් 02 කට අදාළ රු.මිලියන 14.4 ක් වටිනා නිමි ද්‍රව්‍ය තොග වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට භාජනය කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 245 | සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කරන ලද ගෙවීම් වවුචර පිළිබඳ නියැදි පරීක්ෂාවට අනුව වටිනාකම රු.මිලියන 5.7 ක් වූ ගෙවීම් වවුචර 12 කට අදාළව නිසි පරීක්ෂා කිරීමකින් හා සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/ පීඊඑන්/2011/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ඡේද අංක 01 | සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව සිය අරමුණු වලට පටහැනිව රු. මිලියන 13.78 ක ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් දරා තිබුණි. |
| (ඈ) | 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 (1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | |

| | |
|---|---|
| (i) 01 ඡේදය හා 3.1 ඡේදය | චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව සංස්ථාවේ සේවකයින්ට ප්‍රසාද දීමනා ලෙස රු.මිලියන 4 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ii) 3.3 ඡේදය | ප්‍රසාද දීමනා ගෙවීමේ දී සංස්ථාවේ පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 28 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් 2013 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2014 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමෙන් පසු එනම් 2014 දෙසැම්බර් 10 වන දින ඉදිරිපත් කර තිබුණි. |
| (ඉ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛය | |
| (i) 2.14.1 ඡේදය | 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වටිනාකම රු.මිලියන 100 ඉක්ම වූ යකඩ මිලදී ගැනීම් සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවක අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 7.9.5 හා 7.9. 6 ඡේද | මිලදී ගැනීම් කටයුතු වලදී දේශීය ලංසුකරුවන්ට ප්‍රමුඛත්වය ලබාදිය යුතු වුවද 2012, 2013 සහ 2014 වර්ෂයන්හි දී සිදුකල යකඩ මිලදී ගැනීමේ දී පූර්ණ දේශීය හිමිකාරීත්වයක් ඇති මෙල්වයර් රෝලින් පුද්ගලික සමාගමින් මිලදී ගැනීම සිදු නොකොට දේශීය හිමිකාරීත්වය සියයට 6.25 ක් පමණක් වන ලංකා වානේ සමාගමෙන් වැඩි මිලකට යකඩ මිලදී ගැනීම් සිදුකර තිබුණි. |
| (iii) 5.4.4 (1) ඡේදය | සමාලෝචිත වර්ෂය තුළ සී සීටී ව්‍යාපෘතියට අදාළව සිදු කරනු ලැබූ උපකොන්ත්‍රාත් 09 ක් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 40 සිට සියයට 75 දක්වා වූ වටිනාකම් වලින් උපකොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඊ) 2014 අගෝස්තු 04 දිනැති අංක 2014/100 දරන සංස්ථාවේ සාමාන්‍යාධිකාරිගේ අභ්‍යන්තර චක්‍රලේඛය | සහකාර ප්‍රමාණ සමීක්ෂණ තනතුරු සඳහා බඳවා ගැනීමේ දී ජාතික තාක්ෂණික සහතිකය සම්පූර්ණ කිරීමෙන් පසු වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු වුවද, වසර 1 ½ සිට වසර 2 ½ දක්වා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් 06 දෙනෙකු මෙම තනතුරු සඳහා බඳවා ගෙන තිබුණි. |
| (උ) 1996 මැයි 12 දිනැති අංක 108 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රු.මිලියන 11.29 ක පරිත්‍යාග සිදුකොට තිබුණි. |

| | | |
|---|---|---|
| (ඍ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත<br>4 ඡේදය | 2014 වර්ෂය තුළ සේවයෙන් ඉවත් වූ සේවකයින් 44 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් දින 03 සිට දින 352 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද වී තිබුණු අතර ඒ සඳහා කිසිදු දඩ මුදලක් ගෙවා නොතිබුණි. |

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 74.5 ක ශුද්ධ ලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. මිලියන 122.7 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 48.2 කින් හෙවත් සියයට 39 කින් පිරිහී තිබුණි.

ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේදී අනෙකුත් ආදායම් රු. මිලියන 177.7 කින් ඉහල ගොස් ආදායම් බදු වියදම රු. මිලියන 53.7 කින් අඩුවී තිබුණ ද ඉදිකිරීම් උපාංග අංශයේ හැර අනෙකුත් සියලු අංශ වල මෙහෙයුම් ලාභය සැලකිය යුතු ලෙස පිරිහීම හේතුවෙන් සංස්ථාවේ දළ ලාභය රු. මිලියන 180 කින් පිරිහීම, පරිපාලන වියදම් රු. මිලියන 111 කින් ඉහල යාම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.**

---

පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ඉදිකිරීම් අංශයේ මෙහෙයුම් ලාභය රු. මිලියන 120.8 කින් හෙවත් සියයට 75 කින් ද විශේෂ මෙහෙයුම් අංශයේ මෙහෙයුම් ලාභය රු. මිලියන 65.5 කින් හෙවත් සියයට 37 කින් ද යාන්ත්‍රික හා විදුලි අංශයේ මෙහෙයුම් ලාභය රු. මිලියන 4.8 කින් හෙවත් සියයට 33 කින් ද යන්ත්‍රෝපකරණ හා උපාංග අංශයේ මෙහෙයුම් ලාභය රු. මිලියන 6.9 කින් හෙවත් සියයට 15 කින් ද උපදේශන සේවා අංශයේ මෙහෙයුම් ලාභය රු. මිලියන 47.8 කින් හෙවත් සියයට 51 කින් ද පිරිහී තිබුණි.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි.**

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට එරෙහිව පවරන ලද නඩු 13 ක් තීන්දු අපේක්ෂාවෙන් පැවති අතර ඒවා අතරින් සමථයකට පත් නොවූ හිමිකම් වටිනාකම රු.මිලියන 161.2 ක් වූ නඩු 05 ක් විය. තව ද බාහිර පුද්ගලයින් 04 දෙනෙකුට එරෙහිව සංස්ථාව විසින් නඩු පවරා තිබුණු අතර එහි හිමිකම් ප්‍රමාණය රු.මිලියන 3.1 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය.**

---

**4.1 කාර්ය සාධනය.**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් අංශයට අයත් රත්මලාන ඇලුමිනියම් කර්මාන්ත ශාලාවෙහි 2013 වර්ෂයේ වූ රු. මිලියන 20.9 ක මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 1.8 ක අලාභයක් බවට පත් වී තිබුණි. වැඩබිමෙහි පිරිවැටුම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 16.5 කින් ඉහල ගොස් තිබුණද විකුණුම් පිරිවැය හා අනෙකුත් වියදම් ඊට වඩා වැඩි ප්‍රතිශතයකින් ඉහල යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) ඉදිකිරීම් හා උපාංග අංශයට අයත් දංකොටුව ගඩොල් හා වඩු නිෂ්පාදන අංගනය සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 4.3 ක අලාභයක් ලබා තිබූ අතර පසුගිය වසර 17 න් වසර 16 ක්ම මෙම අංගනය පාඩු ලබා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය රු. මිලියන 32.05 ක් වූ අතර වැඩබිමේ ආදායම වැඩිවීමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් විකුණුම් පිරිවැය ඉහලයාම මීට හේතු වී තිබුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශයට අයත් පෑලියගොඩ සහ රත්මලාන වැඩබිම් 03 ක 2014 වර්ෂයේ රු.මිලියන 5.3 ක මෙහෙයුම් අලාභයක් ද, මාතලේ ඩොලමයිට් පෙරසැරි අංගනයේ රු. මිලියන 4.26 ක අලාභයක් ද සිදු වී තිබුණු අතර ඒ අනුව මෙම වැඩබිමෙහි 2014 දෙසැම්බර් 31 දිනට වූ සමුච්චිත අලාභය රු. මිලියන 65.93 ක් වී තිබුණි.

(ඈ) විශේෂ මෙහෙයුම් අංශයට අයත් ගල්පාත ඇස්ෆලට් සහ ක්‍රෂර් යන්ත්‍ර වැඩබිමෙහි 2013 වර්ෂයේ වූ රු. මිලියන 4.8 ක මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 3.7 ක මෙහෙයුම් අලාභයක් බවට පත්ව තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වැඩබිමෙන් ලැබූ සමුච්චිත අලාභය රු. මිලියන 8.5 ක් වී තිබුණි.

(ඉ) යන්ත්‍රෝපකරණ අංශයේ කොළොන්නාව ප්‍රධාන ගබඩාව ඇතුළු ප්‍රාදේශීය කාර්යාල හා වැඩබිම් 18 ක් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 87.54 ක අලාභයක් ලබා තිබුණි.

(ඊ) යන්ත්‍රෝපකරණ අංශයේ වව්නියාව, කුරුණෑගල, කුලියාපිටිය යන ප්‍රාදේශීය කාර්යාල පසුගිය වර්ෂයේ ලබා තිබූ රු. මිලියන 33.15 ක සමුච්චිත ලාභය ප්‍රවර්තන වර්ෂයේ දී රු. මිලියන 11.65 දක්වා සියයට 65 කින් පිරිහී තිබුණු අතර අම්පාර , තමන්කඩුව, කල්මුණේ, කුණ්ඩසාලේ, හොරණ යන ප්‍රාදේශීය කාර්යාල හා කොළොන්නාව ප්‍රධාන ගබඩාව සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ආදායමක් ලබා නොතිබුණු නමුත් මෙම වැඩබිම් සඳහා රු. මිලියන 4.4 ක වියදමක් සමාලෝචිත වර්ෂයේ දී දරා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් සිදු කරන ලද කෙරීගෙන යන ව්‍යාපෘති අතුරින් ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් උපාංග අංශය, යාන්ත්‍රික හා විදුලි අංශය, යන්ත්‍රෝපකරණ හා උපාංග අංශය යන අංශයන්ට අදාළ ව්‍යාපෘති 55 ක් වර්ෂය තුල අලාභ ලබා ඇති අතර එම අලාභය රු. මිලියන 426.4 ක් විය.

## 4.2 මූල්‍ය කළමනාකරණය

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය අයකර ගැනීමේ ක්‍රමවත් පරිපාටියක් හා විධිමත් කාරක ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියක් නොමැතිවීම හේතුවෙන් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 353.7 ක අයිරා පහසුකම් ලබාගෙන තිබූ අතර එම අයිරා පහසුකමද ඉක්මවා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 450 ක් දක්වා අයිරා ලබා ගෙන තිබුණි. මෙම බැංකු අයිරා සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 56 ක පොලියක් ගෙවා තිබුණි.

(ආ) සංස්ථාවේ පවතින අයහපත් ද්‍රවශීලතාවය හේතුවෙන් ලබා ගෙන තිබූ රු. මිලියන 100 ක බිල්පත් ප්‍රතිග්‍රහණය කිරීමේ පහසුකම සමාලෝචිත වර්ෂයේ දී ද සියයට 16 ක පොලී ප්‍රතිශතයක් මත පවත්වාගෙන ගොස් තිබූ අතර ඒ සඳහා ගෙවන ලද මුළු පොලිය රු. මිලියන 16.28 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 450 ක බැංකු අයිරාවක් පැවතියදී එකතුව රු. මිලියන 172.6 ස්ථාවර තැන්පතුවක් හා ඉතුරුම් / කාලීන තැන්පතුවක් ද, රු. මිලියන 13.6 ක කෙටිකාලීන ආයෝජන ද, වෙළඳපොළ අගය රු. මිලියන 7.93 ක් වූ කොටස් වෙළඳපොළ ආයෝජනයක් ද පවත්වා ගෙන ගොස් තිබුණි. එම ආයෝජනයන් තුළින් වර්ෂය තුළ උපයාගෙන තිබුණේ රු. මිලියන 11.3 ක ආයෝජන ප්‍රතිලාභයක් පමණි.

(ඈ) විදේශයන්හි ඉදිකිරීම් ව්‍යාපෘති ඇරඹීම සඳහා සංස්ථාව විසින් කටාර් හා නේපාලය යන රටවල පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් දෙකක පවතින එකතුව රු. මිලියන 7.8 ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ද නිෂ්කාර්යව පැවතිණි.

**4.3 ව්‍යාපෘති කළමනාකරණය - පැලියගොඩ- සී සිටි ව්‍යාපෘතිය.**

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය 2013 ජූලි 06 දින ආරම්භකර 2014 ජනවාරි 31 දින අවසන් කිරීමට අපේක්ෂා කලද, භෞතික පරීක්ෂාව සිදුකළ 2015 සැප්තැම්බර් 03 දින වන විටත් ව්‍යාපෘති කටයුතු අවසන් නොකොට නවතා දමා තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දින වනවිට රු. මිලියන 557.5 ක් වැය කොට තිබුණද, වැඩ විෂයයන් 18 කින් වැඩ විෂයයන් 12 කට අදාළව කිසිදු ඉදිකිරීම් කාර්යයක් සිදුකර නොතිබූ බැවින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ආ) මගී සෝපාන සවි කිරීමේ හා පළමු මහලේ ඩියුරා සවිකිරීමේ උපකොන්ත්‍රාත්තු 2014 දෙසැම්බර් 10 වන දින ආරම්භකොට 2015 ජනවාරි 15 වන දින අවසන් කිරීමට ගිවිසුම් ගතව තිබූ අතර ඒ සඳහා පිළිවෙලින් රු.මිලියන 1.63 ක් හා රු.මිලියන 7.47 ක් සචලීකරණ අත්තිකාරම් ගෙවා තිබුණි. මෙම ගිවිසුම් සඳහා උපකොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කරන ලද අත්තිකාරම් බැඳුම්කරයන්හි වලංගු කාලය අවසන් වී තිබුණු හෙයින් සංස්ථාවට රු.මිලියන. 9.11 ක අලාභයක් සිදු වී තිබූ අතර ප්‍රමාද කාලය වෙනුවෙන් අයකරගත හැකිව තිබූ රු.මිලියන. 2.63 ක දඩ මුදල ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට හා වෙනත් රාජ්‍ය ආයතන වලට අයත් වටිනාකම රු.මිලියන 79.61 ක් වූ පර්චස් 688 ක ඉඩම් හා රු.මිලියන 32.31 ක් වූ ගොඩනැගිලි සංස්ථාවේ ගිණුම් වලට ගෙන තිබුණද, ඒවායේ අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාවෙහි අනුරාධපුර විකුණුම් මධ්‍යස්ථානය හා සංචාරක බංගලාව පවත්වාගෙන යන භූමියෙහි අක්කර 01 පර්චස් 88 ක භූමි ප්‍රමාණයක් හා 1964 අංක 28 දරණ ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ සංස්ථාවේ මධ්‍යම ශාඛාව හා මධ්‍යම වැඩපොල ඇරඹීමේ අරමුණින් සංස්ථාව වෙත පවරා තිබූ පැලියගොඩ ඉඩමෙහි වූ අක්කර 07 ක භූමි ප්‍රමාණයක් බාහිර පුද්ගලයින් විසින් අනවසරයෙන් භුක්ති විඳින නමුත් කලමණාකරණය විසින් ඒ පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදිකිරීම්, ඉදිකිරීම් හා උපාංග, යන්ත්‍රෝපකරණ හා උපාංග, යාන්ත්‍රික හා විදුලි යන අංශයන්ට අදාලව ඉන්වොයිස් පිළියෙල කිරීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් පිරිවැයට වඩා ඉතා ඉහල වටිනාකමක් සහිතව හා පිරිවැයට වඩා ඉතා අඩුවෙන් ඉන්වොයිස් ඉදිරිපත් කල අවස්ථා විය. මෙම තත්ත්වය ජංගම වත්කම් සහ ජංගම වගකීම් තුළ ඇතුලත්

ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු හා ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු වටිනාකම් අසාමාන්‍ය ලෙස අධිගණනය වීමට හා අවගණනය වීමට හේතු වී තිබුණි.

**4.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ දී රු. මිලියන 372 ක ආයෝජනයක් සහිතව විශේෂ මෙහෙයුම් අංශයේ ව්‍යාපෘතියක් ලෙස ඇස්ෆලට් හා ක්‍රෂර් යන්ත්‍ර වැඩබිමක් පිහිටුවා තිබුණද, එහි නිෂ්පාදන කටයුතු ආරම්භක දින සිට දින 64 ක් වැනි සුළු කාල සීමාවකට සීමාවී 2015 ජනවාරි 05 දින වන විට නවතා තිබුණි. ඒ අනුව, වැඩබිම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ ඇමරිකානු ඩොලර් මිලියන 3.27 ක් වටිනා ඇස්ෆලට් හා ක්‍රෂර් යන්ත්‍රය ද, ඊට අදාළ උපාංග ද නිෂ්පාදන කටයුතු නතර කිරීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතිණි. එසේම, ඇ. ඩොලර් මිලියන 1.02 ක් වටිනා ක්‍රෂර් යන්ත්‍රය හා ටිරක් රථ 04 ක් මේ දක්වා කිසිදු නිෂ්පාදන කටයුත්තකට භාවිතා නොකර නිෂ්කාර්යව තිබුණි. තවද, එම භූමි ප්‍රමාණය සඳහා වසර 05 ක කුලී මුදල ලෙස රු. මිලියන 4.5 ක් හා ඊට අදාළ ඇප තැන්පතුව ලෙස රු. මිලියන 2.3 ක් ගෙවා තිබුණු අතර නිෂ්පාදනයක් සිදුනොවූ කාල සීමාව තුළ ගෙවනු ලැබූ රු.මිලියන 3.4 ක මුදල නිෂ්කාර්යය වැය දැරීමක් වී තිබුණි.

(ආ) මුළු භූමි ප්‍රමාණය අක්කර 14 පර්චස් 1.3 ක වපසරියකින් යුතු ඒකළ පෙරසවි අංගනය පිහිටි වැඩබිමේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ප්‍රයෝජනයට ගෙන තිබුණේ තුනෙන් එකක පමණ භූමි ප්‍රමාණයක් වූ අතර ඉතිරිය වල් බිහි වී තිබුණි.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු.**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජය විසින් සංස්ථාවට පවරා දී තිබූ පැලියගොඩ පිහිටි ඉඩමෙන් අක්කර 2.5 ක වපසරියකින් යුතු භූමි ප්‍රමාණයක් භාවිතයට ගෙන ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය සඳහා තාක්ෂණික සේවා උද්‍යානයක් හා අඩු වියදම් නිවාස ආකෘති කිහිපයක් සමාලෝචිත වර්ෂයේ 2014 ජනවාරි 31 දින දී සාදා නිම කර තිබුණි. එම ගොඩනැගිලි ඵලදායී කටයුත්තකට නොයොදා වර්ෂය අවසාන වන විටත් නිෂ්ක්‍රීයව තිබූ අතර ඉදිකිරීම් සඳහා රු. මිලියන 2.2 මුදලක් ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයෙන් ලැබිය යුතුව තිබුණි. තවද, නිෂ්ක්‍රීයව පවතින වැඩබිමෙහි ආරක්ෂක සේවාවන් සඳහා 2014 වර්ෂයේ සිට 2015 සැප්තැම්බර් දක්වා රු. මිලියන 1.2 ක මුදලක් සංස්ථාව විසින් වැය කර තිබුණි.

(ආ) කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව දීප ව්‍යාප්තව සිවිල් වැඩ ව්‍යාප්ත කිරීමේ අරමුණින් බඳවා ගත් අලෙවි ප්‍රවර්ධන නිළධාරින්ගෙන් 30 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ දී සේවය කර තිබූ අතර ඔවුන්ට රු. මිලියන 11.14 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. එසේ වුවද, මාතලේ, දංකොටුව වැනි ස්ථාන වල පිහිටි නිෂ්පාදන වැඩබිම් වල පිරිවැටුම සමාලෝචිත වර්ෂයේදී ද වැඩිවී නොතිබුණු අතර ඒවා දිගින් දිගටම අලාභ ලබන තත්ත්වයේම පැවතුණි. සමාලෝචිත වර්ෂයේ දී ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් ලෙස රු. මිලියන 8.89 ක් දරා තිබුණ ද, ඵලදායී නව ව්‍යාපෘති කිසිවක් ආරම්භ කර නොතිබුණි.

**4.7 හඳුනාගන්නා ලද පාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති 44 ක කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා කොන්ත්‍රාත් පිරිවැය දැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු. මිලියන 564.81 ක සමුච්චිත අලාභයක් සිදු වී තිබුණි.

(ආ) පාරිතෝෂික දීමනා ගෙවීමේදී නියමිත කාල පරිච්ඡේදය තුළ නොගෙවීම හේතුවෙන් රු. 165,970 ක් අධිභාර ලෙස ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකිරීම් කොන්ත්‍රාත් නියමිත දිනට අවසන් නොකිරීමේ හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 8.38 ක මුදලක් ගෙවීමට සංස්ථාවට සිදු වී තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සංස්ථාවේ සම්පත්**

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයේ විධානයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාව විසින් වාහන 38 ක් ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයට මුදාහැර තිබුණි. වාහන සඳහා ඉන්ධන වියදම් සහ කුලී ගාස්තු ලෙස රු. මිලියන 31.78 ක වියදම් දරා තිබුණු අතර අමාත්‍යාංශයට නිදහස් කල රියදුරන් 22 දෙනෙකුට වැටුප් සහ අතිකාල දීමනා වශයෙන් රු. මිලියන 9.83 ක් ද ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සේවයට වාර්තා නොකොට සංස්ථාවෙන් වැටුප් ලැබූ උපදේශක, මාධ්‍ය නිළධාරී, ඡායාරූප ශිල්පී, අලෙවිකරණ නිළධාරීන් යන තනතුරු වලට අයත් නිළධාරීන් සංඛ්‍යාව 46 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ ඔවුන් සඳහා රු. මිලියන 17 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. මීට අමතරව රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්වරයෙකු සඳහා අනුමැතියකින් තොරව රු. 870,000 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

**4.9 කාර්ය මණ්ඩල පරිපාලනය.**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යය මණ්ඩලය 2943 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 3047 ක් වීමෙන් සේවකයන් 104 ක අතිරික්තයක් විය. එහෙත් එදිනට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 175 ක් පැවති අතර අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් සේවක සංඛ්‍යාව 271ක් සහ අනියම් සේවක සංඛ්‍යාව 08 ක් වීමෙන් කාර්ය මණ්ඩලයේ අතිරික්තයක් ඇති වී තිබුණි.

(ආ) සංස්ථාවේ ඉහල කළමණාකරනය නියෝජනය වන තනතුරු 09 ක් සඳහා 2006 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනමින් සේවකයින් බඳවා ගෙන තිබුණු අතර තනතුරු 16 කට අදාළ නිළධාරීන් 69 දෙනෙකු 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතීම සංස්ථාවේ කාර්ය සාධනයට සෘජුව බලපා තිබුණි. 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ එම නිළධාරීන්ගේ සේවක පිරිවැටුම ද ඉහල අගයක් ගෙන තිබුණි.

(ඇ) 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (11) දරන කළමණාකරණ සේවා චක්‍රලේඛය සහ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු ඇතිකිරීම හෝ පුරප්පාඩු පිරවීම සිදු නොකල යුතු වුවද, අනුමත නොවූ තනතුරු 23 ක් ඇතිකර ඒ සඳහා සේවකයින් 70 ක් බඳවාගෙන තිබුණි.

(ඇ) 2011 පෙබරවාරි 14 දිනැති අංක ඩීඑම්එස් / ඊ3/43/4/265/1 දරණ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව අනුමත ස්ථිර නුපුහුණු සේවක සංඛ්‍යාව 260 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදුණු තත්‍ය සේවක සංඛ්‍යාව 531 ක් විය.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම දින 356 ක කාල ප්‍රමාදයකින් පසුව 2016 පෙබරවාරි 19 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 හා 2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී 47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව 2012 – 2015 කාල පරිච්ඡේද වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කොට නොතිබුණි. එසේ වුවද, 2012-2015 කාලපරිච්ඡේදයට පිළියෙල කරන ලද සංයුක්ත සැලැසුම තුළ ඒ ඒ වර්ෂයන් සඳහා වූ ක්‍රියාකාරී සැලසුම් සාරාංශ කොට දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාව විසින් ළඟාවිය යුතු ඉලක්කයන් සපුරාගැනීමට ඉටුකල යුතු ක්‍රියාකාරකම් 98 ක් ඉටුකර ගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි. තවද, එම ක්‍රියාකාරකම් ඉටුකිරීමෙන් සපුරාගැනීමට අපේක්ෂාකල අරමුණු අතරින්, ප්‍රමිතීන් අත්පත් කර ගැනීම, මෝස්තර සංකල්ප වැඩි දියුණු කිරීම, පද්ධති වැඩි දියුණු කිරීම, මූල්‍යමය වශයෙන් ශක්තිමත් වීම, ජාතික සංවර්ධන වැඩසටහනට දායකවීම, ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම, වෙළෙඳපොල සූක්ෂම වීම හා මානව සම්පත් අන්තර්ග්‍රහණය හා රඳවා ගැනීම යනා දී අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත සහ තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 10 සිට සියයට 100 පරාසයක් දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

**5.5 ප්‍රසම්පාදන සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 4.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කොට තිබුණද, එය අමාත්‍යාංශ අනුමැතිය සඳහා යොමුකොට තිබුණේ 2014 මැයි මස 09 දිනදීය.

(ආ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ රු. මිලියන 2,624.55 ක් වටිනා අයිතමයන් අත්පත් කර ගැනීමට සැලසුම් කොට තිබුණද සත්‍ය වශයෙන් වැය කොට තිබුණේ රු. මිලියන 379.7 ක් හෙවත් අපේක්ෂිත වටිනාකමින් සියයට 14.4 ක් පමණි. තවද, මේ අතරින් රු. මිලියන 70.74 ක් වටිනා මෝටර් වාහන

අත්පත් කර ගැනීමට සැලසුම් කොට තිබුණ ද, මේ සඳහා කිසිදු මුදලක් වැය කොට නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංස්ථාවේ අවශ්‍යතාවයක් හා මූල්‍යමය හැකියාවට සුදුසු අයුරින් පිළියෙල කොට නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.6 වාර්ෂික වාර්තා**

----------------

සංස්ථාව විසින් 2012 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2015 අප්‍රේල් 08 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

**5.7 නොවිසඳී ඇති විගණන ඡේද**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ කරන ලද සේවා සැපයුම් මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් සංස්ථාවට රු. මිලියන 168.99 ක එකතු කල අගය මත බදු ලැබිය යුතුව තිබුණද, එකී මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 ජූනි 16 දින සිට 2012 ජූනි 15 දින දක්වා වූ අවුරුද්දක කාලපරිච්ඡේදයක් සඳහා පමණක් සංස්ථා සේවකයින්ට ජීවිත රක්ෂණාවරණ සහ වෛද්‍ය රක්ෂණාවරණ ලබාදීම සඳහා 2011 ජූනි 16 දින එකතුව රු.මිලියන 5.9 ක මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණු අතර එදිනෙන් පසුව රක්ෂණාවරණයක් ක්‍රියාත්මක කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට විදේශ රටවල ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ කර ආදායම් ඉපැයීමට සංස්ථාව උනන්දු වී ඒ සඳහා රු. මිලියන 13 ක් ආරම්භක වියදම් ලෙස වැය කොට තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු විදේශ රටක ඉදිකිරීමක් ඇරඹීමට හෝ කොන්ත්‍රාත් ලබාගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ඈ) ඉහල පොලී අනුපාතයන් යටතේ බැංකු අයිරා පහසුකම් ලබා නොගැනීම, ඩොලමයිට් පෙරසවි අංගනයේ අලාභ අවම කර ගැනීම, රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ 108 ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව පරිත්‍යාග සිදු නොකිරීම, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශය වෙත සංස්ථාවේ වාහන මුදා නොහැරීම, කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සිදු නොකිරීම යනාදිය සම්බන්ධයෙන් 2012 නොවැම්බර් 23 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ දී ලබාදුන් නියෝග සම්බන්ධයෙන් අවධානය යොමු කොට නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) තොග පාලනය
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) කාරක ප්‍රාග්ධන කළමණාකරනය
(ඈ) මූල්‍ය පාලනය
(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඊ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(උ) බදු කළමණාකරණය